සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	2	02. මහනුවර රාජධානිය

සැකසුම: කේ.එන්.එන්. දීපානි

බප/හො/ අමරගෙදර ක.වි.

විෂයය අන්තර්ගතය

2.1 හැඳින්වීම

2.2 මහනුවර රාජධානියේ ආරම්භය

2.3 ආර්ථික රටාව

2.4 මහනුවර රාජධානියේ සමාජය

2.5 වාස්තු විද්‍යාව හා කලා ශිල්ප

2.1 හැඳින්වීම

- **මහනුවර රාජධානියේ අගනගරය :-**
  සෙංකඩගල නගරය

- **මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම් :-**
  - සෙංකඩගලපුරය
  - කන්ද උඩරට
  - උඩරට රාජධානිය
  - කන්දෙනුවර රාජධානිය

- **පිහිටීම :-**
  ස්වභාවික ආරක්ෂාව සහිත භූමියක පිහිටි පාලන මධ්‍යස්ථානයකි.

❖ මහනුවර රාජධානියට ආරක්ෂාව ලැබෙන

- **ගංගාව** :- මහවැලි ගඟ
- **කඳුවැටි** :- උඩවත්ත කඳුවැටිය
  හන්තාන කඳුවැටිය
- **දුර්ග මාර්ග** :- බලන
  හුන්නස්ගිරිය



පැරණි මහනුවර නගරය

2.2 මහනුවර රාජධානියේ ආරම්භය

- කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ මහනුවර ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයට යටත් පාලන ඒකකයක් ලෙස පැවතීම.

- එම රජතුමා යටතේ ජෝතිය නම් සිටුවරයෙක් උඩරට පාලන කටයුතුවල නිරත වීම.

- ඔහු උඩරට කෝට්ටේ රාජ්‍යයෙන් නිදහස් කර ගැනීම සඳහා හයවන පරාක්‍රමබාහු රජතුමාට විරුද්ධව කැරැල්ලක් ඇති කළ අතර එය අසාර්ථක වීම.

- හයවන පරාක්‍රමබාහු රජුගේ මරණයෙන් පසු කෝට්ටේ රාජධානිය ක්‍රමයෙන් දුර්වල වීම.

සේනාසම්මත වික්‍රමබාහු රජතුමා

- මෙම තත්ත්වය තේරුම් ගත් සේනාසම්මත වික්‍රමබාහු නම් ප්‍රභූවරයෙක් උඩරට කෝට්ටේ රාජධානියෙන් නිදහස් කරගෙන සෙංකඩගල නගරය මුල් කර ගනිමින් මහනුවර රාජධානිය ආරම්භ කිරීම.

- මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා සේනාසම්මත වික්‍රමබාහු රජු වීම.

ජයවීර බණ්ඩාර රජතුමා

- සේනාසම්මත වික්‍රමබාහු රජුගෙන් පසු ඔහු පුත් ජයවීර බණ්ඩාර උඩරට රජු බවට පත් වීම.

- එවකට කෝට්ටේ රාජධානිය කෝට්ටේ,සීතාවක හා රයිගම වශයෙන් කොටස් තුනකට බෙදී පැවතීම.

- උඩරට රාජධානියේ ස්වාධීනත්වය ආරක්ෂා වීමට එය හේතු වීම.

- 16 වන සියවසේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසුව ඔවුන් කෝට්ටේ රාජ්‍යයත් සමඟ සබඳතා ඇති කර ගෙන ක්‍රමයෙන් එහි දේශපාලන කටයුතුවලට මැදිහත් වීම.

- උඩරට ජයවීර බණ්ඩාර රජු සමඟ ද සබඳතා ඇති කර ගැනීමට පෘතුගීසීන් උත්සහ ගත් නමුත් එය අසාර්ථක වීම.

කරලියද්දේ බණ්ඩාර රජතුමා

- ජයවීර බණ්ඩාර රජුගෙන් පසු ඔහු පුත් කරලියද්දේ බණ්ඩාර උඩරට පාලකයා බවට පත් වීම.

- කරලියද්දේ බණ්ඩාර උඩරට පාලකයා බවට පත් වීම ගැන සීතාවක පාලකයෝ අකමැති වීම.

- සීතාවක රාජ්‍යයෙන් එල්ල වූ මෙම තර්ජන නිසා කරලියද්දේ බණ්ඩාර රජු පෘතුගීසීන් සමඟ හිතවත් වීම.

- තම පාලකයා විදේශීය ජාතියක් සමඟ හිතවත්ව එම සංස්කෘතිය පිළිගනිමින් කටයුතු කිරීම ගැන උඩරට ප්‍රභූවරු කලකිරීම.

- මේ නිසා උඩරට ප්‍රභූවරයෙකු වූ වීරසුන්දර බණ්ඩාර සීතාවක රාජසිංහ රජතුමාට උඩරට අත්පත් කර ගැනීමට සහය වීම.

- සීතාවක රාජසිංහ රජතුමා උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ ඊට මුහුණ දීමට නොහැකි වූ කරලියද්දේ බණ්ඩාර රජතුමා, තම දියණිය වූ කුසුමාසන දේවිය හා බෑණා කෙනෙකු වූ යමසිංහ බණ්ඩාර ඇතුළු රජ පවුලත් සමඟ මන්නාරමට පලා ගොස් පෘතුගීසි රැකවරණය පැතීම.

- ඔවුන් පෘතුගීසීන් වෙතින් බෞතිස්ම ලැබීම.
  - කුසුමාසන දේවිය - දෝන කතිරිනා
  - යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්

- ක්‍රි.ව. 1580 දී පමණ උඩරට රාජ්‍ය යටත් කරගත් පළමුවන රාජසිංහ රජතුමා සීතාවක සිට උඩරට පාලනය කිරීම.

- කෙටි කාලයක් ගත වන විට පළමුවන රාජසිංහ රජතුමා හා වීරසුන්දර බණ්ඩාර අතර මතබේදයක් ඇති වී එහි ප්‍රතිඵලයක් ලෙස රජු විසින් වීරසුන්දර බණ්ඩාර මරණයට පත් කරවීම.

- පියාගේ මරණයෙන් පසු වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර ජීවිත ආරක්ෂාව පතා පෘතුගීසීන් වෙත පලා යාම.

- දොන් ජුවන් නමින් බෞතිස්ම ලැබූ ඔහු පෘතුගීසීන්ට හිතවත්ව කටයුතු කිරීම.

උඩරට කැපීපෙනෙන රජවරු

පළමුවන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි.ව. 1592 - 1604)

- උඩරට අත්පත් කරගත් සීතාවක රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගෙන බෞද්ධ භික්ෂූන්ට එරෙහිව කටයුතු කිරීම.
- මේ නිසා උඩරට ප්‍රභූවරුන් තුළ ද රජු කෙරෙහි කලකිරීමක් ඇති වීම.
- එම අවස්ථාව ප්‍රයෝජනයට ගත් පෘතුගීසීන් තම රැකවරණය යටතේ සිටි යමසිංහ බණ්ඩාර කුමරු උඩරටට යවා රජකමට පත් කිරීම.
- පෘතුගීසීන් විසින් යමසිංහ බණ්ඩාරගේ ආරක්ෂාව පිණිස කොනප්පු බණ්ඩාර කුමරු ද උඩරටට යැවීම.
- කෙටි කලකින් යමසිංහ බණ්ඩාර කුමරු මිය යාම නිසා ඔහුගේ ලාබාල පුත් කුමරු උඩරට සිංහාසනයේ තබා උඩරට රූකඩ පාලනයක් ගෙන යාමට පෘතුගීසීන් උත්සහ කිරීම.

- පෘතුගීන්ට එරෙහිව කටයුතු කරමින් කොනප්පු බණ්ඩාර උඩරට බලය අල්ලා ගැනීම.
- දොන් ජුවන් නමින් තමන් යටතේ බෞතිස්ම ලබා සිටි කොනප්පු බණ්ඩාර තමන්ට එරෙහි වීම ගැන පෘතුගීසීන් කුපිත වීම.
- කොනප්පු බණ්ඩාරගෙන් පළි ගැනීමට පෘතුගීසීන් අවස්ථාවක් සොයමින් සිටීම.
- ක්‍රි.ව. 1592 දී කොනප්පු බණ්ඩාර කුමරු පළමු වන විමලධර්මසූරිය නමින් උඩරට රජවීම.
- මේ නිසා උඩරට රාජධානිය තුළ පෘතුගීසි ගැති පාලනයක් ඇති වීම එමගින් වැළකුණු අතර එය උඩරට රාජධානි ඉතිහාසයේ වැදගත් සිදුවීමක් වීම.

පළමුවන විමලධර්මසූරිය රජතුමා

පළමුවන විමලධර්මසූරිය රජුගේ වැදගත්කම

❖ දේශපාලන සේවය

- ක්‍රි.ව. 1592 සිට 1604 දක්වා උඩරට රජු වශයෙන් කටයුතු කිරීම.
- උඩරට සිංහාසනයට නීත්‍යානුකූල උරුමයක් නොතිබුණු නිසා කරලියද්දේ බණ්ඩාර රජුගේ දියණියක් වූ කුසුමාසන දේවිය (දෝන කතිරිනා) විවාහ කරගනිමින් තම නීත්‍යානුකූල උරුමය තහවුරු කර ගැනීම.
- මේ නිසා උඩරට රාජධානියට අලුත් රජ පෙළපතක් එක් වීම.
  - ✓ සෙනරත් රජු
  - ✓ දෙවන රාජසිංහ රජු
  - ✓ දෙවන විමලධර්මසූරිය රජු
  - ✓ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු එම පරපුරට අයත් වීම.

- සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ විමලධර්මසූරිය රජතුමා ඔහු පරාජය කර සීතාවක බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.

- පෘතුගීසි බලයට එරෙහිව කටයුතු කිරීම.
  - ✓ ක්‍රි.ව. 1594 දන්තුරේ සටනේ දී හා
  - ✓ ක්‍රි.ව. 1602 බලන සටනේ දී පෘතුගීසීන් පරාජයට පත් කිරීම.

❖ ආගමික සේවය

- බුරුමයෙන් උපසම්පදාව රැගෙන ඒම.

- ලංකාතිලකය, ගඩලාදෙණිය වැනි විහාර අලුත්වැඩියා කිරීම.

- ආරක්ෂාව සඳහා දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක් තුළ සඟවා තිබූ දළදාව උඩරටට වැඩමවා තැන්පත් කරවීම.

කුරුවිට දෙල්ගමුව විහාරයේ දළදාව සඟවා තිබූ කුරහන් ගල

ලංකාතිලක විහාරය

සෙනරත් රජතුමා (ක්‍රි.ව. 1604 - 1635)

- පළමුවන විමලධර්මසූරිය රජතුමාගෙන් පසු ඔහුගේ ඥාති සොහොයුරෙකු වූ සෙනරත් කුමරු උඩරට රජු බවට පත් වීම.
- සටනට වඩා සාමකාමීත්වය අගය කළ රජ කෙනෙකු වීම.
- මේ නිසාම ක්‍රි.ව. 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කිරීම.
- එහෙත් එතුමාගේ කාලයේ දී ම පෘතුගීසි කපිතාන් ජනරාල් කොන්ස්තන්තිනෝද සා විශාල සේනාවක් සමඟ පැමිණ ඌව ප්‍රදේශය ආක්‍රමණය කිරීම.
- රජුගේ පුත් මහා අස්ථාන කුමරු උඩරට සේනාව මෙහෙය වූ අතර රන්දෙනිවෙල දී ඇති වූ මෙම සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් වීම.

දෙවන රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1635 - 1687)

- සෙනරත් රජුගෙන් පසු මහා අස්ථාන කුමරු දෙවන රාජසිංහ නමින් බලයට පත් වීම.
- කීර්තිමත් රජෙකු වූ මෙතුමා පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමේ දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම.

දෙවන රාජසිංහ රජතුමා දැක්වෙන සිතුවමක්

දෙවන රාජසිංහ රජුගේ වැදගත්කම

❖ දේශපාලන සේවය

- **පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම සඳහා ලන්දේසීන්ගේ සහය ලබා ගැනීම්**
  - ✓ ක්‍රි.ව. 1638 දී රජු හා ලන්දේසීන් අතර ගිවිසුමක් ඇති වීම.
  - ✓ දෙපාර්ශ්වය එක් වී පෘතුගීසීන්ට එරෙහිව ප්‍රහාර එල්ල කොට ක්‍රි.ව. 1658 දී පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීම.
- **උඩරට රාජධානියේ බල ප්‍රදේශය පුළුල් කිරීමට කටයුතු කිරීම.**
- **පෘතුගීසීන් නෙරපා හැර සමස්ථ දිවයිනේම පාලකයා වීමේ අරමුණක් රජු සතු විම.**
  - ✓ පෘතුගීසීන්ගෙන් අත්පත් කර ගත් ප්‍රදේශ ලන්දේසීන් තමන් යටතේ තබා ගැනීම ඊට බාධාවක් වීම.
  - ✓ එතෙක් පෘතුගීසීන් යටතේ වූ ප්‍රදේශ රැසක් උඩරටට එකතු කර ගැනීමට මෙතුමාට හැකි වීම.

- **ගන්නෝරු සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත් වීම්**

✓ ක්‍රි.ව. 1592 දී දියෝගු ද මෙලෝ නම් පෘතුගීසි කපිතාන් ජනරාල්වරයාගේ හමුදාව පරාජයට පත් කොට රජු ජය ලැබීම.

- **උඩරට රාජධානි ඉතිහාසයේ දීර්ඝ කාලයක් පාලන කටයුතු මෙහෙය වූ රජු වීම.**

✓ ක්‍රි.ව. 1635 සෙනරත් රජුගේ මරණයෙන් පසු ක්‍රි.ව. 1687 දක්වා මෙතුමා පාලන කටයුතු මෙහෙය වීම.

දෙවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1687 - 1707)

- දෙවන රාජසිංහ රජුගෙන් පසු ඔහු පුත් දෙවන විමලධර්මසූරිය කුමරු බලයට පත් වීම.
- මෙතුමා බොහෝ සාමකාමී පාලකයකු වීම.
- පහත රට ප්‍රදේශවල සිටි ලන්දේසීන් සමග සුහදව කල් ගෙවීම කැපී පෙනෙන ලක්ෂණයක් වීම.

දෙවන විමලධර්මසූරිය රජුගේ වැදගත්කම

- ❖ බුද්ධ ශාසනය නගා සිටු වීම සඳහා බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරට උපසම්පදාව පිහිටු වීම.
- ❖ දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (ක්‍රි.ව. 1707 - 1739)

- ක්‍රි.ව. 1707 දෙවන විමලධර්මසූරිය රජුගේ මරණයෙන් පසු ඔහු පුත් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ කුමරු උඩරට බලයට පත් වීම.
- උඩරට රාජධානි ඉතිහාසයේ දුර්වල පාලකයකු වූ මෙතුමාගේ කාලයේ උඩරට ප්‍රභූ පන්තියේ බලය වර්ධනය වීම.
- පියා මෙන්ම මෙතුමන් ද ඉන්දියානු කුමාරිකාවක විවාහ කරගැනීම.
- එම විවාහයෙන් රජකමට උරුම පුතෙකු නොසිටීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස නායක්කර් වංශිකයෝ උඩරට බලයට පැමිණීම.

ශ්‍රී විජය රාජසිංහ රජතුමා
(ක්‍රි.ව. 1739 - 1747)

- උඩරට රාජ්‍යයේ බලයට පත් පළමු නායක්කර් වංශික රජතුමා වීම.
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ නායක්කර් බිසවගේ සහෝදරයෙකු වීම.

ශ්‍රී විජය රාජසිංහ රජතුමාගේ වැදගත්කම

- සරණංකර සඟරාජ හිමියන්ගේ බුද්ධ ශාසනික කටයුතුවලට උපකාර කිරීම.
- එහිමියන්ගේ උපදෙස් පරිදි බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒමට කටයුතු කළත් එය සාර්ථක නොවීම.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782)

- ශ්‍රී විජය රාජසිංහ රජුට සිංහාසන උරුමක්කරුවෙකු නොසිටි බැවින් ඔහුගේ මරණයෙන් පසු අගබිසවගේ සොහොයුරෙකු කීර්ති ශ්‍රී රාජසිංහ නමින් උඩරට රජ වීම.

- එවකට ඔහුගේ වයස අවුරුදු 16 ක් පමණ වීම.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ වැදගත්කම

- **ආගමික සේවය**

  - **බුද්ධ ශාසනය නගා සිටු වීම සඳහා සියමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරට උපසම්පදාව පිහිටු වීම.**
    - ✓ බුදු සසුනේ විශාල පිරිහීමක් ඇතිව තිබු බැවින් එවකට උපසම්පදාව ලැබු භික්ෂූන් වහන්සේලා රට තුළින් සොයා ගැනීමට නොහැකි වීම.

- ✓ සරණංකර හිමිගේ උපදෙස් පරිදි රජු ලන්දේසීන්ගෙන් නැව් ලබා ගෙන සියමයට දූතයන් යැවීම.

- ✓ උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා මෙරටට වැඩමවා 1753 වර්ෂයේ දී උපසම්පදා උත්සවයක් පැවැත් වීම.

- ✓ ඒ සමඟ ම වර්තමානය දක්වා පවතින සියම් නිකාය ආරම්භ වීම.

- **වැලිවිට සරණංකර හිමියන් සංඝරාජ පදවියට පත් කිරීම.**

- **උඩරට හා පහතරට ප්‍රදේශවල අබලන්ව තිබූ වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරවීම.**
  - ✓ උදා : දඹුලු විහාරය

- **රජතුමා හින්දු භක්තිකයෙකු වුව ද වාර්ෂිකව දළදා පෙරහර පැවැත් වීමට උපකාර කිරීම.**
  - ✓ දළදා පෙරහැරට දේවාල පෙරහර ද එක්කොට වඩා උත්කර්ෂවත් කිරීම.

දේශපාලන සේවය

- **ලන්දේසීන් පලවා හැරීම සඳහා ඉංග්‍රීසීන්ගෙන් ආධාර ලබා ගැනීමට උත්සහ කිරීම.**
  - ✓ රජුගේ ඉල්ලීම පරිදි ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි දූතයෙකු 1762 දී මහනුවරට පැමිණ රජු මුණ ගැසීම.
  - ✓ එහෙත් එම දූත ගමනින් සාර්ථක ප්‍රතිඵල නොලැබීම.
  - ✓ රජු ඉංග්‍රීසීන්ගෙන් උදව් පතන බව දැනගත් පසු ලන්දේසීන්ගෙන් උඩරටට එල්ල වූ තර්ජන තවත් වැඩි වීම.
  - ✓ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලන්දේසීහු 1765 වර්ෂයේ දී උඩරට ආක්‍රමණය කළ ද ඔවුන්ගේ අරමුණ ඉටු කරගත නොහැකි වීම.
  - ✓ දිගින් දිගට ම පැවති ලන්දේසී තර්ජන නිසා දිගු කාලීනව සාමයක් අපේක්ෂා කළ රජතුමා 1766 වර්ෂයේ දී ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කිරීම.
  - ✓ එම ගිවිසුමෙන් උඩරට රාජධානියට මුහුදු වෙරළක් අහිමි කිරීමටත්, එමගින් රජු විදේශීය රාජ්‍යයන් සමඟ පවත්වන සබඳතා බිඳ දමීමටත් ලන්දේසීන් ප්‍රයත්න දරා ඇත. එහෙත් එම ගිවිසුමේ බොහෝමයක් කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම.

කීර්ති ශ්‍රී රජසිංහ රජතුමාගේ ප්‍රතිමාවක්

කීර්ති ශ්‍රී රජසිංහ රජතුමා සරණංකර සංඝරාජ හිමියන්ට විපිනිපත පිළිගැන්වීම දැක්වෙන සිතුවමක්



දඹුලු විහාරය

රාජාධිරාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1782 - 1798)

- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගෙන් පසු ඔහුගේ සොහොයුරා රාජාධිරාජසිංහ නමින් රජකමට පත් වීම.
- මෙතුමා භක්තිමත් බෞද්ධයෙකු වීම.
- ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් අත්පත් කොට ගත්තේ මෙතුමාගේ කාලයේ දී වීම.
- 1798 වර්ෂයේ දී මෙතුමා මිය යාම.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1798 - 1815)

- රාජාධිරාජසිංහ රජතුමා මිය යන විට රජකමට උරුමකම් කිව හැකි කුමාරවරු දෙදෙනෙකු සිටීම.
  - කන්නසාමි කුමරු
  - මුත්තුසාමි කුමරු

- උඩරට මහාදිකාරම් වූ පිළිමතලව්වේගේ සහය කන්නසාමි කුමරුට හිමි වීම.

- ඒ අනුව පිළිමතලව්ව මහාදිකාරම්ගේ මැදිහත් වීමෙන් ලාබාල වියේ සිටි කන්නසාමි කුමරු වර්ෂ 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජ වීම.

- මුත්තුසාමි කුමරු ආරක්ෂාව පතා ඉංග්‍රීසීන් වෙත පලා ගිය අතර ඔහුට ඉංග්‍රීසීන්ගේ රැකවරණය ලැබීම.

- තමාට හිතවත් කන්නසාමි කුමරු රජකමට පත් කිරීමෙන් ඔහු හැමදාම තමාට අවනතව තබාගැනීමට පිළිමතලව්වේ කල්පනා කිරීම.

- මෙම රජු මුලදී පිළිමතලව්වේගේ අදහස් පිළිගත් මුත් පසුව තම ඥාතීන්ගේ බසට අවනත ව ක්‍රියා කිරීම.

- මේ නිසා රජු හා පිළිමතලව්ව අතර මතබේද ඇති වීම.
- පිළිමතලව්වේ ඉංග්‍රීසීන්ගේ ආධාර ලබා ගෙන රජුට එරෙහිව ක්‍රියා කිරීමට උත්සහ කළ නමුත් එම වැඩ පිළිවෙළ අසාර්ථක වීම.
- එවකට මුහුදුබඩ ප්‍රදේශවල මුල් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ලෙස ෆෙඩ්රික් නෝර්ත් කටයුතු කිරීම.
- ඔහුට උඩරට යුධ ශක්තිය හා උපක්‍රම පිළිබඳ අවබෝධයක් නොවීම.
- 1803 වර්ෂයේ දී ඔහු උඩරට අත්පත් කර ගැනිම සඳහා ආක්‍රමණයක් දියත් කොට තම රැකවරණ ලබා සිටි මුත්තුසාමි කුමරුන් උඩරට රජු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.
- එහෙත් රට වැසියන්ගේ සහය ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට හිමි වීමෙන් එම ආක්‍රමණය අසාර්ථක වීම හා මුත්තුසාමි කුමරු ජීවිතක්ෂයට පත් වීම.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ වැදගත්කම

- ක්‍රි.ව. 1798 - 1815 දක්වා උඩරට පාලනය කිරීම.
- දළදා මාළිගාවට චිත්තාකර්ෂණීය පත්තිරිප්පුව එක් කිරීම.
- මාලිගාව ඉදිරිපිට ඇති කිරි මුහුද නම් වැව තැනවීම.

දේශපාලන වාතාවරණය

- මෙතුමාගේ පාලන කාලය තුළ දේශපාලන අර්බුදයක් ඇති වීම.
- රජු හා රදල ප්‍රභූ පන්තිය අතරත් රජු හා පොදු ජනතාව අතරත් පැවති සබඳතාව බිඳ වැටීම.

- මහනුවර රාජධානිය තුළ ම රජු අනාරක්ෂිත වීම.
- මෙම තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් එවකට මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූ රොබට් බ්‍රවුන්රිග් උඩරට ආක්‍රමණය කිරීම.
- එවකට උඩරට මහඅධිකාරම් වූ ඇහැලෙපොල හා රජු අතර ගැටුමක් ඇති වීම නිසා ඔහු ඉංග්‍රීසීන්ගේ රැකවරණය ලබා සිටීම.
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට එරෙහිව ඉංග්‍රීසීන් එල්ල කළ ආක්‍රමණයේදී ඇහැලෙපොලගේ සහය ඉංග්‍රීසීන්ට ලැබීම.
- උඩරට වැසියන් බොහෝදෙනෙකු රජු කෙරෙහි කලකිරී සිටි බැවින්, මෙවර ඉංග්‍රීසීන් උඩරටට පැමිණීම වැළැක්වීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම.
- කිසිදු අපහසුවකින් තොරව මහනුවර නගරයට ඇතුළු වීමට ඉංග්‍රීසීන් සමත් වීම.
- රජවාසලින් පලා ගොස් මැදමහනුවර ප්‍රදේශයේ නිවසක සැඟ වී සිටි රජු උඩරැටියන් විසින් සොයා ගෙන ඉංග්‍රීසීන්ට භාර දීම.
- මෙසේ රජු අත්අඩංගුවට ගැනීමෙන් වෙනත් කිසිඳු යුරෝපීයයෙකු උඩරට දී නොලත් ජයක් ලැබීමට ඉංග්‍රීසිහු සමත් වීම.

උඩරට ගිවිසුම

- රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරට ප්‍රභූන් සමඟ ගිවිසුමක් අත්සන් කිරීම.
- එය 1815 වර්ෂයේ මාර්තු දෙවන දින ගිවිසුම හෙවත් උඩරට ගිවිසුම වශයෙන් ප්‍රසිද්ධියට පත් වීම.
- මෙම ගිවිසුම අනුව උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් බව පිළිගෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇතුළු නායක්කර්වරුන්ට උඩරට සිංහාසනයට තිබූ සියලු උරුමයන් අහෝසි කිරීම.
- මෙසේ උඩරට ස්වාධිපත්‍ය අහෝසි වීමත් සමඟ සමස්ත දිවයිනම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම.
- අත්අඩංගුවට පත් වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ වෙල්ලෝරයට රැගෙන යාම.

2.3 ආර්ථික රටාව

කෘෂිකර්මය

- මෙරට සාම්ප්‍රදායික ජීවන ක්‍රමය වූ කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථික රටාව ක්‍රියාත්මක වීම.

- තෙත් කලාපය තුළ ශීඝ්‍ර ජන ව්‍යාප්තියක් පැවති නමුත් තෙත් කලාපයට වර්ෂය පුරා පැතිරුණ වර්ෂාවක් ලැබුණ බැවින් වියළි කලාපයේ මෙන් වැව් අමුණු තනා ජලය රැස් කර තබා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබීම.

- මහනුවර ආශ්‍රිත ව කඳුකර ප්‍රදේශ බහුල වූ බැවින් හෙල්මළු ක්‍රමයට අහස් දියෙන් වී වගාව සිදු කිරීම.

- පහත රට ප්‍රදේශවල තවදුරටත් සාමාන්‍ය පරිද්දෙන් කුඹුරු වගාව පැවතීම.

- කුඹුරු ගොවිතැනට අමතරව හේන් ගොවිතැන ද සිදු කිරීම.
  - කුරක්කන්, මිනේරි, තල, ඉරිඟු ආදිය හේන්වල වගා කිරීම.

- කොස්, දෙල්, ගම්මිරිස්, අලවර්ග, සාදික්කා, කරඳමුංගු, පුවක්, එළවළු, පලතුරු ආදිය ගෙවතුවල වගා කිරීම.

- ගව පාලනය සිදු කිරීම.
  - කිරි ලබා ගැනීම
  - ගොවිතැන් කටයුතු සඳහා
  - ප්‍රවාහන කටයුතු සඳහා

කුරුඳු මිටි බැඳ සැකසීම

වෙළඳාම

- දේශීය වෙළඳාම මෙන්ම විදේශීය වෙළඳාම ද පැවතීම.
- මුහුදුබඩ ප්‍රදේශවල නිෂ්පාදන උඩරට ප්‍රදේශවලට අලෙවි කෙරුණ අතර උඩරට ප්‍රදේශවල නිෂ්පාදන පහතරට ප්‍රදේශවලට අලෙවි කිරීම.
- වෙළඳාමේ දී කාසි භාවිත වූ අතර භාණ්ඩ හුවමාරු ක්‍රමය ද පැවතීම.
- උඩරට හා පහතරට අතර කඩවත් තනා තිබුණ අතර වෙළඳ ද්‍රව්‍ය ප්‍රවාහනය මෙම කඩවත් හරහා සිදු වීම.
  - කඩවත් යනු ලන්දේසීන්ගේ සීමාවන් හා උඩරට රාජ්‍යයේ සීමාවන් අතර පැවති මුරපොළවල් ය.
- විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතීම.
- මුහුදුබඩ ප්‍රදේශවල සිටි යුරෝපීයයන් සමඟ රජු වෙළඳ සබඳතා පැවැත් වූ අතර ඉන්දියාව හා උඩරට අතර ද වෙළඳ සබඳතා පැවතීම.

උඩරට රාජ්‍ය සමයේ හුවමාරු වූ වෙළඳ භාණ්ඩ

අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය හා සතුන්	ආනයනය කළ වෙළඳ ද්‍රව්‍ය හා සතුන්
කුරුඳු	අශ්වයන්
ගම්මිරිස්	පිඟන් භාණ්ඩ
පුවක්	රෙඳි පිළි
ඇත් දත්	මැටි බඳුන්
ඇතුන්	සුවඳ වර්ග
මුතු මැණික්	කරවල
බුලත්	
කරඳමුංගු	
කරාබුනැටි	
සාදික්කා	
මී ඉටි	

කර්මාන්ත

- එකල රාජධානියේ බොහෝ කටයුතුවලට අවශ්‍ය කාර්මික නිෂ්පාදන හා භාණ්ඩ රට තුළම නිෂ්පාදනය කිරීම.
- ඒ සඳහා කුල පදනම් කරගත් වෙනම ශිල්පීය පරම්පරාවක් සිටීම.
- ඔවුන් දිගු කලක සිට පරම්පරාවෙන් පරම්පරාවට ඒ ඒ ශිල්පීය දැනුම පවත්වා ගෙන ආ පිරිසක් වීම.
- මැටි, තඹ, පිත්තල, යකඩ, ලෝහ ආදියෙන් විවිධ භාණ්ඩ හා උපකරණ නිෂ්පාදනය කිරීම.
- මේ සඳහා ඒ ඒ ශිල්පීන්ගෙන් සමන්විත ගම් පිහිටුවා තිබීම.
- ඒ ඒ ශිල්පීය කණ්ඩායම්වලට නායකත්වය දෙන නායකයෝ පත්ව සිටීම.
- භාණ්ඩ අලංකරණය සඳහා ලාක්ෂා කර්මාන්තය යොදා ගැනීම.
- එක් එක් කර්මාන්ත සඳහා ප්‍රසිද්ධියට පත් ප්‍රදේශ පැවතීම.
  - යකඩ කර්මාන්තය - කොත්මලේ
  - පන් කර්මාන්තය - දුම්බර

2.3 මහනුවර රාජධානියේ සමාජය

- එකල පැවති ග්‍රාමීය සමාජය තුළ ගම ස්වයංපෝෂිත වීම.
- ඒ ඒ කුල හෝ ශිල්ප ශ්‍රේණි සඳහා වෙන් වෙන් ව ගම් පිහිටුවා තිබීම.
- රාජ්‍යයේ බහුතර පිරිස ගොවියන් වූ අතර සියලු ශිල්පීන් අතර හොඳ සබඳතාවක් පැවතීම.
- අන්‍යෝන්‍ය සහයෝගය සහ සහජීවනය, සාමූහිකත්වය සමාජය තුළ හොඳින් ආරක්ෂා වී තිබීම.

- සමාජයේ පූජ්‍ය පක්ෂය, ප්‍රභූ පන්තිය හා සාමාන්‍ය ජනතාව යනුවෙන් ස්ථර තුනක් දැකිය හැකි වීම.
- ප්‍රභූ පන්තිය සමාජයේ කැපී පෙනෙන ම බලවේගය වූ අතර රජු හැරුණු විට පාලන කටයුතුවල යෙදී සිටි ප්‍රධානීන් ප්‍රභූ පන්තියට අයත් වීම.
- රදලයන් යන නාමය ද ඔවුන් සඳහා භාවිත වීම.
- සාමාන්‍ය ජනතාවට ගොවියන්, කම්කරුවන්, වෙළෙන්දන් හා ඉහත කී විවිධ ශිල්පීය කණ්ඩායම් ද ඇතුළත් වීම.

පවුල් ඒකකය

- උඩරට ජන සමාජයේ පවුල් ඒකකය ශක්තිමත්ව පැවතීම.
- පියාගෙන් පසුව දේපල දරුවන්ට උරුම වන ක්‍රමයක් පැවතීම.
- පියා මුල් කරගත් මෙම සමාජ ක්‍රමය පිතෘ මූලික සමාජයක් වීම.
- උඩරට සමාජයේ කැපී පෙනෙන විවාහ ක්‍රම දෙකක් පැවතීම.
    - දීග විවාහය - මනාලිය මනාලයාගේ නිවසට කැන්දාගෙන ගොස් එහි ජීවත් වීම.
    - බින්න විවාහය - මනාලයා මනාලියගේ නිවසේ පදිංචි වී සිටීම.
- මීට අමතරව සහෝදරයන් කිහිපදෙනෙකු සිටින පවුලකට එක් මනාලියක කැඳවා ගෙන ඒමේ සිරිතක් පැවතීම්
    - කෘෂිකාර්මික සමාජයක දේපල බෙදී යාම වළක්වා ගැනීමට මෙබඳු විවාහ ක්‍රම උපයෝගී කර ගැනීම.

2.4 වාස්තු විද්‍යාව හා කලා ශිල්ප

- ගම්පොළ හා කෝට්ටේ රාජ්‍ය සමයේ පැවති ගෘහ නිර්මාණ ශිල්ප ආශ්‍රයෙන් සැකසුණු වාස්තු විද්‍යාවක් පැවතීම.

- ගොඩනැගිලි ඉදි කිරීම් අතර ආගමික ගොඩනැගිලිවලට විශේෂ තැනක් හිමි වීම.
  - උදා:- දළදා මාළිගාව
    ඇම්බැක්කේ දේවාලය
    ලංකාතිලක විහාරය
    හින්දු දේවාල

- ටැම්පිට විහාර ඉදි කිරීමේ සම්ප්‍රදායක් පැවතීම

  - පොළොවේ දැව කණු සිටුවා ඒ මත ගොඩනැගිලි ඉදි කළ විට වේයන් වැනි සතුන්ගෙන් දැව කණුවලට හානි පැමිණ ගොඩනැගිලි විනාශයට පත් වීම.

  - මෙය වළක්වා ගැනීම සඳහා පොළොවට ගල් කණු සිටුවා එම ගල් කණුවලට ලී කණු පුරුද්දා හෝ බාල්ක යොදා ටැම්පිට විහාර ඉදි කිරීම.

  - මහනුවර රාජ සමයට අයත් විහාර බිතු සිතුවම්, ලී කැටයම් හා ප්‍රතිමා ආදියෙන් එකල පැවති කලා කුසලතාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.

ඇම්බැක්කේ දේවාලයේ ලී කණුවක්

ඇම්බැක්කේ දේවාලය

මැදවෙල ටැම්පිට විහාරය

මහනුවර යුගයට අයත් චිත්‍ර කලාව

- බුදු දහමේ හරය ජනතාව වෙතට ගෙන යාමේ මාධ්‍යයක් ලෙස චිත්‍ර කලාව යොදා ගැනීම.

- එකල චිත්‍ර කලාවේ දක්නට ලැබෙන ලක්ෂණ අතර,
  - උගත් නූගත් සියලුදෙනාට තේරුම්ගත හැකි පරිදි චිත්‍ර නිරූපණය කිරීම.
  - බිත්ති තීරුවලට බෙදා කතාවක් පියවරෙන් පියවර ඉදිරිපත් කිරීමේ දීර්ඝ කතා ක්‍රමය භාවිත කිරීම.
  - එක් එක් රූප රාමුවට යටින් කතා පුවත කෙටියෙන් නම් කර තිබීම.
  - හිස්තැන් පිරවීමට මල්, රූප ඇඳ තිබීම.

- සත්ත්ව, ශාක හා මිනිස් රූපවල ප්‍රමාණාත්මක ගුණය නොසලකා හැර තිබීම.

- ශාක හා ඛනිජවලින් සාම්ප්‍රදායික වර්ණ සකසා ගෙන තිබීමත්, රතු වර්ණය වැඩිපුර භාවිත කිරීමත් දැකිය හැකි වීම.

- ජාතක කතා වැඩි වශයෙන් චිත්‍රයට නගා තිබීම.
  - ✓ උදා:- වෙස්සන්තර ජාතකය
    දහම්සොඬ ජාතකය
    තේලපත්ත ජාතකය

- වර්තමානයේ මහනුවර යුගයට අයත් චිත්‍ර දැකගත හැකි ස්ථාන,
  - ✓ දඹුල්ල
  - ✓ දෙගල්දොරුව
  - ✓ දළදා මාළිගාව
  - ✓ මුල්ගිරිගල

මහනුවර යුගයට අයත් චිත්‍රයක්

සවියෙන් පෙරට අපි එකට
***e-* ඉගෙනුම් පාසල**
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	**2**	**02.** මහනුවර රාජධානිය -ඇගයීම

සැකසුම- කේ එන් එන් දීපානි

බප/හො/ අමරගෙදර ක. වි

මහනුවර රාජධානියේ ආරම්භය

1* මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම් මොනවාද?

2* මහනුවර රාජධානියේ අගනුවර කුමක්ද?

3* එම රාජධානියට ආරක්ෂාව ලැබුණු ක්‍රම මොනවාද?

4* උඩරට ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයෙන් නිදහස් කර ගැනීම සඳහා කැරැල්ලක් ඇති කළ පුද්ගලයා කවුද?

5* එවකට කෝට්ටේ පාලකයා කවුද?

6* මහනුවර රාජධානියේ ආරම්භක රජතුමා කවුද?

7* සීතාවක රාජ්‍යයෙන් එල්ල වූ තර්ජන නිසා පෘතුගීසි රැකවරණය පතා ගිය උඩරට පාලකයා කවුද?

8* පහත සඳහන් අය බෞතිස්ම ලැබීමෙන් පසු හැඳින් වූ නම් මොනවාද?

i. කුසුමාසන දේවිය

ii. යමසිංහ බණ්ඩාර

iii. කොනප්පු බණ්ඩාර

9* පළමුවන රාජසිංහ රජුට උඩරට අත්පත් කර ගැනීමට උපකාර කළ උඩරට ප්‍රභූවරයා කවුද?

10* පළමු වන විමලධර්මසූරිය රජු රාජ්‍යත්වයට පත් වූයේ කුමන වර්ෂයේදී ද?

11* රජ වීමට පෙර ඔහු හැඳින් වූ නම කුමක්ද?

12* පළමුවන විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ දේශපාලන සේවාවන් දෙකක් සඳහන් කරන්න.

13* පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඉටු වූ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න.

14* සෙනරත් රාජ්‍ය සමයේ උඩරටට එල්ල වූ පෘතුගීසි ආක්‍රමණය කෙටියෙන් හඳුන්වන්න.

15* සෙනරත් රජු වෙනුවෙන් එම ආක්‍රමණය මෙහෙය වන ලද්දේ කවුරුන්ද?

16* දෙවන රාජසිංහ රජු රජ වීමට පෙර හැඳින් වූ නාමය කුමක්ද?

17* දෙවන රාජසිංහ රාජ්‍ය සමයේ උඩරටට එල්ල වූ පෘතුගීසි ආක්‍රමණය කෙටියෙන් හඳුන්වන්න.

18* දෙවන රාජසිංහ රජුගෙන් ඉටු වූ සේවාවන් තුනක් සඳහන් කරන්න.

19* දෙවන විමලධර්සූරිය රාජ්‍ය සමයේ දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණය කුමක්ද?

20* එතුමාගෙන් ඉටු වූ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න.

21* ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු නායක්කර් පෙළපත බලයට පත් වීමට හේතුව කුමක්ද?

22* නායක්කර් රජවරු පිළිවෙළින් සඳහන් කරන්න.

23* කීර්ති ශ්‍රී රාජසිංහ රජුට අනුශාසනා ලබා දෙමින් බෞද්ධ පුනරුදයේ පුරෝගාමියා ලෙස කටයුතු කරන ලද්දේ කවුරුන්ද?

24* කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් ඉටු වූ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න.

25* එතුමාගේ පාලන සමය තුළ මෙරටට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා කවුරුන්ද?

26* කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා පෘතුගීසීන් අතර ගිවිසුමක් ඇති වූයේ කුමන වර්ෂයේදී ද?

27* ඉංග්‍රීසීන් විසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගන්නා විට උඩරට සිටි පාලකයා කවුද?

28* රාජාධිරාජසිංහ රජු මිය යන විට උඩරට රාජ්‍යයට උරුමකම් කිමට සිටි කුමාරවරු දෙදෙනා කවුද?

29* කන්නසාමි කුමරු රාජ්‍යත්වයට පත් කිරීමට මුල් වූයේ කවුරුන්ද?

30* කන්නසාමි කුමරු රජ වූ පසු හැඳින් වූ නම කුමක්ද?

31* ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා පිළිමතලව්වේ මහදිකාරම් අතර මතබේදයක් ඇති වීමට හේතුව කුමක්ද?

32* ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමයේ උඩරටට එල්ල කළ ප්‍රථම ඉංග්‍රීසි ආක්‍රමණය කුමක්ද?

33* එවකට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරා කවුද?

34* එම ආක්‍රමණයේ ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

35* ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් ඉටු වූ සේවාවන් දෙකක් සඳහන් කරන්න.

36* එතුමාගේ පාලන සමයේ ඇති වූ දේශපාලන අර්බුදය කුමක්ද?

37* එම තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් උඩරට ආක්‍රමණය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුද?

38* එම ආක්‍රමණයේ ප්‍රතිඵල මොනවාද?

39* උඩරට ගිවිසුම යනු කුමක්ද?

40* ඉංග්‍රීසීන් විසින් අත්අඩංගුවට ගන්නා ලද ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රැගෙන යන ලද්දේ කොහේටද?

මහනුවර රාජධානියේ ආර්ථික රටාව

1* මහනුවර රාජධානියේ ආර්ථික රටාවේ කැපීපෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

2* මහනුවර ආශ්‍රිතව කඳුකර ප්‍රදේශවල කුඹුරු ගොවිතැන සඳහා භාවිත කළ ක්‍රමය කුමක්ද?

3* සත්ත්ව පාලනයෙන් ලබා ගත් ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

4* මහනුවර රාජධානියේ වෙළඳාම් කටයුතුවල දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

5* කඩවත් යනු මොනවාද?

6* උඩරට රාජධානි සමයේ අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය හා සතුන් නම් කරන්න.

7* උඩරට රාජධානි සමයේ ආනයනය කළ වෙළඳ ද්‍රව්‍ය හා සතුන් නම් කරන්න.

8* උඩරට රාජධානි සමයේ කර්මාන්තවල දක්නට ලැබුණු ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

9* භාණ්ඩ අලංකරණය සඳහා පැවති කර්මාන්තය කුමක්ද?

10* පහත සඳහන් කර්මාන්ත සඳහා ප්‍රසිද්ධියට පත් ප්‍රදේශ මොනවාද?

i. යකඩ කර්මාන්තය

ii. පන් කර්මාන්තය

මහනුවර රාජධානියේ සමාජය

1* මහනුවර රාජධානියේ කැපීපෙනෙන සමාජීය ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

2* සමාජය බෙදී පැවතුණු ස්ථර තුන කුමක්ද?

3* මහනුවර රාජධානියේ පැවති සමාජ ක්‍රමය කුමක්ද?

4* උඩරට සමාජයේ කැපි පෙනෙන විවාහ ක්‍රම දෙක කුමක්ද?

5* මීට අමතරව පැවති වෙනත් විවාහ ක්‍රමයක් සඳහන් කරන්න.

මහනුවර රාජධානියේ වාස්තු විද්‍යාව හා කලා ශිල්ප

1* මහනුවර රාජධානියේ වාස්තු විද්‍යාව සඳහා ආභාසය ලැබී ඇත්තේ කුමකින්ද?

2* එවකට පැවති ආගමික ගොඩනැගිලි සඳහා නිදසුන් දක්වන්න.

3* ටැම්පිට විහාර යනු කුමක්ද?

4* මහනුවර රාජධානියට අයත් ටැම්පිට විහාරයක් සඳහා නිදසුනක් දක්වන්න.

5* මහනුවර යුගයේ චිත්‍ර කලාවේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

6* චිත්‍රයට නැඟීම සඳහා බහුල වශයෙන් යොදා ගත් ජාතක කතා තුනක් නම් කරන්න.

7* වර්තමානයේ මහනුවර යුගයට අයත් චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන හතරක් සඳහන් කරන්න.

සවියෙන් පෙරට අපි එකට
***e-* ඉගෙනුම් පාසල**
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	**2**	**02.** මහනුවර රාජධානිය - පිළිතුරු

සැකසුම- කේ එන් එන් දීපානි
බප/හො/ අමරගෙදර ක. වි

මහනුවර රාජධානියේ ආරම්භය

1. සෙංකඩගලපුරය, කන්ද උඩරට, උඩරට රාජධානිය, කන්දෙනුවර රාජධානිය

1* සෙංකඩගල නගරය

2* ගංගාව :- මහවැලි ගඟ

කඳුවැටි :- උඩවත්ත කඳුවැටිය

හන්තාන කඳුවැටිය

දුර්ග මාර්ග :- බලන

හුන්නස්ගිරිය

3* ජෝතිය සිටුවරයා

4* හයවන පරාක්‍රමබාහු රජතුමා

5* සේනාසම්මත වික්‍රමබාහු රජතුමා

6* කරලියද්දේ බණ්ඩාර රජතුමා

7* i කුසුමාසන දේවිය - දෝන කතිරිනා

ii යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්

iii කොනප්පු බණ්ඩාර - දොන් ජුවන්

8* වීරසුන්දර බණ්ඩාර

9* ක්‍රි.ව. 1592 දී

10* කොනප්පු බණ්ඩාර

11*

- ❖ සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ විමලධර්මසූරිය රජතුමා ඔහු පරාජය කර සීතාවක බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.
- ❖ පෘතුගීසි බලයට එරෙහිව කටයුතු කිරීම.

ක්‍රි.ව. 1594 දන්තුරේ සටනේ දී හා

ක්‍රි.ව. 1602 බලන සටනේ දී පෘතුගීසීන් පරාජයට පත් කිරීම.

12*

- ❖ බුරුමයෙන් උපසම්පදාව රැගෙන ඒම.
- ❖ ලංකාතිලකය, ගඩලාදෙණිය වැනි විහාර අලුත්වැඩියා කිරීම.
- ❖ ආරක්ෂාව සඳහා දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක් තුළ සඟවා තිබූ දළදාව උඩරටට වැඩමවා තැන්පත් කරවීම.

13* පෘතුගීසි කපිතාන් ජනරාල් කොන්ස්තන්තිනෝද සා විශාල සේනාවක් සමඟ පැමිණ ඌව ප්‍රදේශය ආක්‍රමණය කිරීම.

14* සෙනරත් රජුගේ පුත් මහා අස්ථාන කුමරු

15* මහා අස්ථාන කුමරු

16* ගන්නෝරු සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත් වීම.

ක්‍රි.ව. 1592 දී දියෝගු ද මෙලෝ නම් පෘතුගීසි කපිතාන් ජනරාල්වරයාගේ හමුදාව සමඟ ගන්නෝරුවේ දී කළ සටනින් පෘතුගීසීන් පරාජයට පත් කොට රජු ජය ලැබීම.

17*

- ❖ පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම සඳහා ලන්දේසීන්ගේ සහය ලබා ගැනීම.
- ❖ උඩරට රාජධානියේ බල ප්‍රදේශය පුළුල් කිරීමට කටයුතු කිරීම.
- ❖ ගන්නෝරු සටනින් පෘතුගීසීන් අන්ත පරාජයකට පත් වීම.

18* පහත රට ප්‍රදේශවල සිටි ලන්දේසීන් සමඟ සුහදව කල් ගෙවීම

19*

- ❖ බුද්ධ ශාසනය නඟා සිටු වීම සඳහා බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරට උපසම්පදාව පිහිටු වීම.
- ❖ දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම.

20* සිය පියා මෙන්ම ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ද ඉන්දියානු කුමාරිකාවක විවාහ කර ගත් අතර එම විවාහයෙන් රජකමට උරුම පුතෙකු නොසිටීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස නායක්කර් පෙළපතේ ප්‍රතිපත්තියට අනුව නායක්කර් වංශිකයෝ උඩරට බලයට පැමිණීම.

21*

- ශ්‍රී විජය රාජසිංහ රජතුමා
- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
- රාජාධිරාජසිංහ රජතුමා
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

22*වැලිවිට සරණංකර හිමියන්

23*

- බුද්ධ ශාසනය නගා සිටු වීම සඳහා සියමයෙන් උපසම්පදාව ගෙන්වා උඩරට උපසම්පදාව පිහිටු වීම.
- වැලිවිට සරණංකර හිමියන් සංඝරාජ පදවියට පත් කිරීම.
- උඩරට හා පහතරට ප්‍රදේශවල අබලන්ව තිබූ වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරවීම.

  උදා : දඹුලු විහාරය
- රජතුමා හින්දු භක්තිකයෙකු වුව ද වාර්ෂිකව දළදා පෙරහර පැවැත් වීමට උපකාර කිරීම හා දළදා පෙරහැරට දේවාල පෙරහර ද එක්කොට වඩා උත්කර්ෂවත් කිරීම.

24*ජෝන් ෆයිබස් නම් ඉංග්‍රීසි දූතයා වර්ෂ 1762 දී

25*ක්‍රි.ව. 1766

26* රාජාධිරාජසිංහ රජතුමා

27*

- කන්නසාමි කුමරු
- මුත්තුසාමි කුමරු

28*උඩරට පිළමතලව්ව මහාදිකාරම්

29*ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

30* තමාට හිතවත් කන්නසාමි කුමරු රජකමට පත් කිරීමෙන් ඔහු හැමදාම තමාට අවනතව තබාගැනීමට පිළිමතලව්වේ කල්පනා කළ ද මෙම රජු මුලදි පිළිමතලව්වේගේ අදහස් පිළිගත් මුත් පසුව තම ඥාතීන්ගේ බසට අවනත ව ක්‍රියා කිරීම.

31* 1803 වර්ෂයේ දී ඉංග්‍රීසීන් උඩරට අත්පත් කර ගැනිම සඳහා ආක්‍රමණයක් දියත් කිරීම

32* ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා

33*

- ආක්‍රමණය අසාර්ථක වීම
- මුත්තුසාමි කුමරු ජීවිතක්ෂයට පත් වීම.

34*

- ❖ දළදා මාළිගාවට චිත්තාකර්ෂණීය පත්තිරිප්පුව එක් කිරීම.
- ❖ මාලිගාව ඉදිරිපිට ඇති කිරි මුහුද නම් වැව තැනවීම.

35*රජු හා රදල ප්‍රභූ පන්තිය අතරත් රජු හා පොදු ජනතාව අතරත් පැවති සබඳතාව බිඳ වැටීම

36*රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා

37*

- ❖ රජවාසලින් පලා ගොස් මැදමහනුවර ප්‍රදේශයේ නිවසක සැඟ වී සිටි රජු උඩරැටියන් විසින් සොයා ගෙන ඉංග්‍රීසීන්ට භාර දීම.
- ❖ උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන් අත්පත් කර ගැනීම.
- ❖ මෙසේ උඩරට ස්වාධිපත්‍ය අහෝසි වීමත් සමඟ සමස්ත දිවයිනම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම.

38*

රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරට ප්‍රභූන් සමඟ ගිවිසුමක් අත්සන් කළ අතර එය 1815 වර්ෂයේ මාර්තු දෙවන දින ගිවිසුම හෙවත් උඩරට ගිවිසුම වශයෙන් ප්‍රසිද්ධියට පත් වීම.

39*ඉන්දියාවේ වෙල්ලෝරයට

මහනුවර රාජධානියේ ආර්ථික රටාව

1*

- ❖ මෙරට සාම්ප්‍රදායික ජීවන ක්‍රමය වූ කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථික රටාව ක්‍රියාත්මක වීම.
- ❖ තෙත් කලාපය තුළ ශීඝ්‍ර ජන ව්‍යාප්තියක් පැවති නමුත් තෙත් කලාපයට වර්ෂය පුරා පැතිරුණ වර්ෂාවක් ලැබුණ බැවින් වියළි කලාපයේ මෙන් වැව් අමුණු තනා ජලය රැස් කර තබා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබීම.
- ❖ කුඹුරු ගොවිතැනට අමතරව හේන් ගොවිතැන ද සිදු කිරීම.කුරක්කන්, මිනේරි, තල, ඉරිඟු ආදිය හේන්වල වගා කිරීම.
- ❖ කොස්, දෙල්, ගම්මිරිස්, අලවර්ග, සාදික්කා, කරඳමුංගු, පුවක්, එළවළු, පලතුරු ආදිය ගෙවතුවල වගා කිරීම.

2* හෙල්මළු ක්‍රමයට අහස් දියෙන් වී වගාව සිදු කිරීම.

3*

- ❖ කිරි ලබා ගැනීම
- ❖ ගොවිතැන් කටයුතු සඳහා
- ❖ ප්‍රවාහන කටයුතු සඳහා

4*

- ❖ දේශීය වෙළඳාම මෙන්ම විදේශීය වෙළඳාම ද පැවතීම.
- ❖ මුහුදුබඩ ප්‍රදේශවල නිෂ්පාදන උඩරට ප්‍රදේශවලට අලෙවි කෙරුණ අතර උඩරට ප්‍රදේශවල නිෂ්පාදන පහතරට ප්‍රදේශවලට අලෙවි කිරීම.
- ❖ වෙළඳාමේ දී කාසි භාවිත වූ අතර භාණ්ඩ හුවමාරු ක්‍රමය ද පැවතීම.
- ❖ උඩරට හා පහතරට අතර කඩවත් තනා තිබුණ අතර වෙළඳ ද්‍රව්‍ය ප්‍රවාහනය මෙම කඩවත් හරහා සිදු වීම.
- ❖ විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතීම.
- ❖ මුහුදුබඩ ප්‍රදේශවල සිටි යුරෝපීයයන් සමඟ රජු වෙළඳ සබඳතා පැවැත් වූ අතර ඉන්දියාව හා උඩරට අතර ද වෙළඳ සබඳතා පැවතීම.

5* කඩවත් යනු ලන්දේසීන්ගේ සීමාවන් හා උඩරට රාජධානියේ සීමාවන් අතර පැවති මුරපොළවල් ය.

6* කුරුඳු, ගම්මිරිස්, පුවක්, ඇත් දත්, ඇතුන්, මුතු මැණික්, බුලත්, කරඳමුංගු, කරාබුනැටි

7* අශ්වයන්, පිඟන් භාණ්ඩ, රෙදි පිළි, මැටි බඳුන්, සුවඳ වර්ග, කරවල

8*

- ❖ එකල රාජධානියේ බොහෝ කටයුතුවලට අවශ්‍ය කාර්මික නිෂ්පාදන හා භාණ්ඩ රට තුළම නිෂ්පාදනය කිරීම.
- ❖ ඒ සඳහා කුල පදනම් කරගත් වෙනම ශිල්පීය පරම්පරාවක් සිටීම.
- ❖ ඔවුන් දිගු කලක සිට පරම්පරාවෙන් පරම්පරාවට ඒ ඒ ශිල්පීය දැනුම පවත්වා ගෙන ආ පිරිසක් වීම.
- ❖ මැටි, තඹ, පිත්තල, යකඩ, ලෝහ ආදියෙන් විවිධ භාණ්ඩ හා උපකරණ නිෂ්පාදනය කිරීම.
- ❖ මේ සඳහා ඒ ඒ ශිල්පීන්ගෙන් සමන්විත ගම් පිහිටුවා තිබීම.
- ❖ ඒ ඒ ශිල්පීය කණ්ඩායම්වලට නායකත්වය දෙන නායකයෝ පත්ව සිටීම.

9* ලාක්ෂා කර්මාන්තය

10*

- ❖ යකඩ කර්මාන්තය - කොත්මලේ
- ❖ පන් කර්මාන්තය - දුම්බර

මහනුවර රාජධානියේ සමාජය

1*

- ❖ එකල පැවති ග්‍රාමීය සමාජය තුළ ගම ස්වයංපෝෂිත වීම.
- ❖ ඒ ඒ කුල හෝ ශිල්ප ශ්‍රේණි සඳහා වෙන් වෙන් ව ගම් පිහිටුවා තිබීම.
- ❖ රාජ්‍යයේ බහුතර පිරිස ගොවියන් වූ අතර සියලු ශිල්පීන් අතර හොඳ සබඳතාවක් පැවතීම.
- ❖ අන්‍යෝන්‍ය සහයෝගය සහ සහජීවනය, සාමූහිකත්වය සමාජය තුළ හොඳින් ආරක්ෂා වී තිබීම.

2*

- ❖ පූජ්‍ය පක්ෂය
- ❖ ප්‍රභූ පන්තිය
- ❖ සාමාන්‍ය ජනතාව

3* පිතෘ මූලික සමාජයක්

4*

- ❖ දීග විවාහය - මනාලිය මනාලයාගේ නිවසට කැන්දාගෙන ගොස් එහි ජීවත් වීම.
- ❖ බින්න විවාහය - මනාලයා මනාලියගේ නිවසේ පදිංචි වී සිටීම.

5* සහෝදරයන් කිහිපදෙනෙකු සිටින පවුලකට එක් මනාලියක කැඳවා ගෙන ඒම

මහනුවර රාජධානියේ වාස්තු විද්‍යාව හා කලා ශිල්ප

1* ගම්පොළ හා කෝට්ටේ රාජ්‍ය සමයේ පැවති ගෘහ නිර්මාණ ශිල්ප ආශ්‍රයෙන්

2*

- ❖ දළදා මාළිගාව
- ❖ ඇම්බැක්කේ දේවාලය
- ❖ ලංකාතිලක විහාරය
- ❖ හින්දු දේවාල

3*

- ❖ පොළොවේ දැව කණු සිටුවා ඒ මත ගොඩනැගිලි ඉදි කළ විට වෙයන් වැනි සතුන්ගෙන් දැව කණුවලට හානි පැමිණ ගොඩනැගිලි විනාශයට පත් වීම.
- ❖ මෙය වළක්වා ගැනීම සඳහා පොළොවට ගල් කණු සිටුවා එම ගල් කණුවලට ලී කණු පුරුද්දා හෝ බාල්ක යොදා ඉදි කරන විහාර ටැම්පිට විහාර නම් වේ.

4* මැදවෙල ටැම්පිට විහාරය

5*

- ❖ උගත් නූගත් සියලුදෙනාට තේරුම්ගත හැකි පරිදි චිත්‍ර නිරූපණය කිරීම.
- ❖ බිත්ති තීරුවලට බෙදා කතාවක් පියවරෙන් පියවර ඉදිරිපත් කිරීමේ දීර්ඝ කතා ක්‍රමය භාවිත කිරීම.
- ❖ එක් එක් රූප රාමුවට යටින් කතා පුවත කෙටියෙන් නම් කර තිබීම.
- ❖ හිස්තැන් පිරවීමට මල්, රූප ඇඳ තිබීම.
- ❖ සත්ත්ව, ශාක හා මිනිස් රූපවල ප්‍රමාණාත්මක ගුණය නොසලකා හැර තිබීම.
- ❖ ශාක හා බනිජවලින් සාම්ප්‍රදායික වර්ණ සකසා ගෙන තිබීමත්, රතු වර්ණය වැඩිපුර භාවිත කිරීමත් දැකිය හැකි වීම.
- ❖ ජාතක කතා වැඩි වශයෙන් චිත්‍රයට නඟා තිබීම.

6*

- ❖ වෙස්සන්තර ජාතකය
- ❖ දහම්සොඬ ජාතකය
- ❖ තේලපත්ත ජාතකය

7*

- ❖ දඹුල්ල
- ❖ දෙගල්දොරුව
- ❖ දළදා මාළිගාව
- ❖ මුල්ගිරිගල